## මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛතා මාර්ග - 2 ව්‍යාපෘතිය - 2012

1. **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

**(අ)** 2012 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

**(ආ)** සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

**(ඇ)** කළමනාකරණය විසින් මාගේ ඉකුත් විගණන වාර්තාවලින් පෙන්වා දුන් කරුණු නිවැරදි කරගැනීමට සතුටුදායක පියවර ගෙන තිබෙන බව හා

**(ඈ)** ණය පහසුකම් ගිවිසුමේ දක්වා තිබූ මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **මූල්‍ය කාර්ය සාධනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති වියදම රු. මිලියන 23,266 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. මිලියන 29,325 ක් විය. සමාලෝචිත වර්ෂයේ වියදම, පසුගිය වර්ෂයේ වියදම හා 2012 දෙසැම්බර් 31 දින සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර 31\ න් අවසන් වර්ෂයේ වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| ස්ථාවර වත්කම් | 147,064 | 2,610 | 149,674 |
| කෙරීගෙන යන වැඩ | 16,100,660,630 | 432,126,680 | 16,532,787,310 |

| | | | |
|---|---|---|---|
| අත්තිකාරම් හා පෙරගෙවීම් | 7,165,552,215 | 5,626,884,014 | 12,792,436,229 |
| | 23,266,359,909 | 6,059,013,304 | 29,325,373,213 |

3. විගණන නිරීක්ෂණ

3.1 ගිණුම්කරණ අඩුපාඩු

විගණනයේදී පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වැඩිපුර ප්‍රතිපාදන සිදුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම්කරන උපචිත වියදම් රු.77,731,936 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) අතුරුගෙවීම් සහතික හරහා වැඩබිමේ ඇති ද්‍රව්‍යවල වටිනාකමින් සියයට 80 කොන්ත්‍රාත්කරු ඉල්ලුම් කළ හැකි නමුත්, වැඩබිමේ ඇති ද්‍රව්‍ය සඳහා රු.1,387,000 ක් ද්‍රව්‍ය මිනුම්පත් පරීක්ෂා කිරීමකින් තොරව කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

2007 අප්‍රේල් 05 දිනැති අංක 33 කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව ව්‍යාපෘති කාර්යමණ්ඩල කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කළ යුතුය. එයට පටහැනිව ව්‍යාපෘති උපදේශක ඒකකය සඳහා අදාල අනුමැතියකින් තොරව නිළධාරීන් 8 දෙනෙකු බඳවාගෙන තිබුණි. තවද ව්‍යාපෘතිය විසින් උපදේශකයන් 4 කු සේවයේ යොදවා තිබු බව නිරීක්ෂණය වූ අතර රු. 1,128,090 පාරිශ්‍රමිකයක් හා ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. නමුත් මෙම උපදේශකයන්ගේ කාර්යසාධන වාර්තා ඉදිරිපත් කර නොමැති බව තවදුරටත් නිරීක්ෂණය විය.

3.3 කොන්ත්‍රාත්තු පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්කරුවන් වැඩබිමෙහි යෙදී ඇතත්, කොන්ත්‍රාත් කොන්දේසි වගන්ති අංක 8.3 අනුව යාවත්කාලීන වැඩසටහන් ඔවුන්ගෙන් ලබාගෙන නොතිබුණි. එවැනි වැඩසටහන් නොමැතිවීම නොයෙකුත් විෂයපථය වෙනස්වීම් සිදුකර තිබූ අතර කොන්ත්‍රාත්තු කටයුතු එදිනෙදා තත්කාර්ය පදනමකින් සිදුකර තිබුණි. එවැනි තත්වයක් සී-6 කොන්ත්‍රාත්තු කටයුතු සම්බන්ධව නිරීක්ෂණය වූ අතර එය කොන්ත්‍රාත්තු පිරිවැය ඉහළ යාමට හා කාලය දීර්ඝ කිරීමට හේතුවිය හැකිය.

**(ආ)** රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් කුලී තක්සේරුවක් ලබාගැනීමකින් තොරව සී-6 කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරුවරයාගේ කාර්යාලය ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂය සඳහා මාසික කුලිය වශයෙන් රු.100,000 ක් ගෙවා තිබුණි.

**(ඇ)** විස්තරාත්මක කොන්ත්‍රාත්තු කොන්දේසි වෙලුම් අංක 2 හි උපවගන්ති 4.8 අනුව ආරක්‍ෂණ ක්‍රමවේදයන්ට හා ප්‍රමාණවත් රථවාහන පාලන වැඩපිළිවෙලකට කොන්ත්‍රාත්කරු වැඩ කරගෙන යන කාලය තුළදී අනුකූල විය යුතුය. 2013 ජුනි 18 දිනැති නේවාසික ඉංජිනේරු නිකුත් කළ අංක පීආර්පී2/සී6සීඩබ්/01/035 දිනැති ලිපිය අනුව කොන්ත්‍රාත්තු අංක සී-6 හි කි.මී. 10+890 සිට කි.මී. 10+988 කොටස හා ඉන් පිටත කි.මී 13 තුළ සැපයූ ආරක්‍ෂණ ක්‍රමවේදයන් හා රථවාහන පාලන යෙදවීම් ප්‍රමාණවත් නොමැති බව නිරීක්‍ෂණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රථවාහන හා පදිකයින් දුෂ්කරතාවලට මුහුණදී තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරියේ මගපෙන්වීම් හා ඔවුන්ගේ රථවාහන පාලන සැලසුම්වලට අනුකූල නොවීම සම්බන්ධව ක්‍රියාමාර්ග නේවාසික ඉංජිනේරුවරයා විසින් ගෙන නොතිබුණි.

**(ඈ)** නේවාසික ඉංජිනේරු නිකුත් කළ අනුකූලනොවීම් වාර්තා අංක 12 හා 13 අනුව (ව්‍යාපෘති අංක ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/සී6) අනුරාධපුර - ගල්කුලම මාර්ග ව්‍යාපෘතියේ කැටගල් වර්ග කිරීම්වලට අදාල ප්‍රමාණයන් මි.මී. 1.18, මි.මී.2.36 හා මි.මී. 4.75 පිරිවිතරයන්ගේ සීමාවන්ගෙන් බැහැරවී තිබුණි. නිවැරදිකිරීම් හා වැළැක්වීමේ ක්‍රියාමාර්ග කොන්ත්‍රාත්කරු නේවාසික ඉංජිනේරු වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් දෙන ලද උපදෙස් අනුව කොන්ත්‍රාත්කරු නිවැරදිකිරීම් කර තිබූ බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවුණු බව තවදුරටත් නිරීක්‍ෂණය විය.

**(ඉ)** සමහර විචලනයන් හඳුන්වාදීම හේතුවෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අනුරාධපුර-ගල්කුලම මාර්ග ව්‍යාපෘතියේ (කොන්ත්‍රාත්තු අංක. ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/6සී) විෂය පථය වෙනස්වී තිබුණු බව නිරීක්‍ෂණය විය. සංශෝධිත වැඩසටහන අනුව සියලු වැඩ 2013 සැප්තැම්බර් 12 සම්පූර්ණ විය යුතුය. මේ සම්බන්ධව පහත නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

**(i)** කැටගල් මිශ්‍රණ ප්‍රමාණයන් ප්‍රමානපත්වල ප්‍රමාණයන්ගෙන් සියයට 35 කට වඩා වැඩිවී ඇත.

**(ii)** උප පාදම් ද්‍රව්‍ය සියයට 500 වඩා වැඩි වී තිබුණි.

**(iii)** කි.මී. 15+000 සිට කි.මී.16+000 දක්වා වූ අලුත් වැඩවල කානු, අඩි පරවල් වැනි විචලන වැඩ (අනුරාධපුර ශික්ෂණ රෝහලට විරුද්ධව පිහිටි පාර) සම්පූර්ණ කළ යුතු මුල් කොන්ත්‍රාත්තු කාලය තුලදී හෝ කොන්ත්‍රාත්තු කාලය දීර්ඝ කර තිබූ කාලය තුලදී නිමකර නොතිබුණි.

**(ඊ)** රජයේ ප්‍රසම්පාදන මගපෙන්වීම් සංග්‍රහයේ ඡේද 1.21(ඊ) අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී හා ඇගයීමේදී විනිවිදභාවයකින් හා ඒකාකාරී බවකින් සහතික කළ යුතුය. කෙසේවෙතත් චීන සංවර්ධන බැංකුවේ ශ්‍රී ලංකා නේවාසික දූත මණ්ඩල ප්‍රධානියා නිකුත් කළ ලිපිය තුන්වන ඡේදයේ උපදෙස් අනුව රු.මිලියන 34,379 කොන්ත්‍රාත්තුව චීන කොන්ත්‍රාත්කරුවන් 3 කුට 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුගමනය කිරීමෙන් තොරව ප්‍රදානය කර තිබුණි.

## 3.4 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** කොන්ත්‍රාත්තු පොදු කොන්දේසි ඡේද අංක 4.4 අනුව මුලු කොන්ත්‍රාත්තුවම උපකොන්ත්‍රාත්කරුට පැවරිය නොහැකිවුවත්, රු.මිලියන 7,275 ක මුළු කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත් අංක සී5බී, සී10ඒ හා සී10 බී උපකොන්ත්‍රාත්කරුවන්ට ඉහත කොන්ත්‍රාත් කොන්දේසිවලට පටහැනිව ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්තු කොන්දේසි අනුව උපකොන්ත්‍රාත්කරුගේ වැඩ සෘජුව අධීක්ෂණය කිරීමට උපදේශකවරුන්ට බලයක් නොමැති බව නිරීක්ෂණය වූ අතර මෙම තත්ත්වය වැඩවල ගුණාත්මකභාවයට හා කාර්යසාධනයට බලපානු ඇත.

**(ආ)** ව්‍යාපෘති වැඩබිම් වාර්තා,මාසික ප්‍රගති වාර්තා අනුව කොන්ත්‍රාත්කරුගේ වැඩ ප්‍රගතිය බලාපොරොත්තුවූ මට්ටමට පහළින් ඇති බව පෙන්නුම්කර තිබුණි. කොන්ත්‍රාත්කරුගේ මාසික අපේක්ෂිත වැඩ සටහන කරගෙන යෑමට පුහුණු හා නුපුහුණු ශ්‍රමය, යන්ත්‍ර හා උපකරණ, වැනි සම්පත් ප්‍රමාණවත් නොමැති බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාණවත් නොවූ සම්පත්වල ප්‍රතිඵලයක් ලෙස ඉදිකිරීම් වැඩවල වැඩ අයිතම් ඉලක්කගත ප්‍රගතියට සැලකිය යුතු ලෙස පිටුපසින් විය. බලාපොරොත්තු වැඩ හා භෞතික ප්‍රගතිය සැසඳීමේදී පහත සඳහන් ප්‍රමාද ප්‍රගතියන් නිරීක්ෂණය විය.

| කොන්ත්‍රාත්තු අංකය | 2012 දෙසැම්බර් 31 දිනට | | බැහැරවීම |
|---|---|---|---|
| | අපේක්ෂිත ප්‍රගතිය | තථ්‍ය ප්‍රගතිය | |
| | % | % | % |

| | | | |
|---|---|---|---|
| **i.** සී21- තිරිවානකැටිය - අගලවත්ත මාර්ගය පාලම නැවත ඉදිකිරීම | 51.52 | 33 | 18.52 |
| **ii.** සී4සී- හොරවල - පැලවත්ත - පිටිගල මාර්ගය | 100 | 27.80 | 72.20 |
| **iii.** සී24- පාලම නැවත ඉදිකිරීම - හොරණ - අගුරුවාතොට - අලුත්ගම මාර්ගය | 67.77 | 58.50 | 9.27 |
| **iv.** සී10ඒ- තිහගොඩ-කඹුරුපිටිය-මාවරල-කොටපොල මාර්ගය | 13.95 | 6.34 | 7.61 |
| **v.** සී10බී- හුංගම-මිද්දෙණිය මාර්ගය | 24.53 | 12.54 | 11.99 |

3.5 **අරමුදල් උපයෝජනය**

සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති මූල්‍යනය, අයවැය ප්‍රතිපාදනය හා අරමුදල් උපයෝජනයට අදාලව සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| | ණය පහසුකම් ගිවිසුමෙන් මූල්‍යයනය සඳහා එකගවූ මුදල | | 2012 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන | 2012 වර්ෂය තුල අරමුදල් උපයෝජනය | 2012 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩොලර් මිලියන | රුපියල් මිලියන | රුපියල් මිලියන | රුපියල් මිලියන | රුපියල් මිලියන | % |
| චීනය | 500 | 50,000 | 15,955 | 15,955 | 19,230 | 38.46 |
| ශ්‍රීලංකා රජය | 56 | 5,600 | 1,918 | 1,918 | 2,481 | 44.30 |
| | 556 | 55,600 | 17,873 | 17,873 | 21,711 | 39.05 |

* උපචිත වියදම් ඇතුලත් නොකිරීම, රඳවාගත් මුදල් සහ තවදුරටත් ඉල්ලුම් කළ යුතු අන්තර් ජංගම ගිණුම් ගණුදෙනු හේතුකොට ගෙන මෙම මුදල මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දැක්වෙන මුදලින් වෙනස්වේ.

3.6 **භෞතික කාර්ය සාධනය**

ලැබී ඇති තොරතුරු අනුව ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තු 19 කට අදාල භෞතික ප්‍රගතිය 2012 දෙසැම්බර් 31 දිනට පහත පරිදි විය.

| අංකය | කොන්ත්‍රාත්තු අංකය | මාර්ගයේ නම/පාලම/ව්‍යාපෘති කාර්යය | ඉලක්කගත සම්පූර්ණ කළ යුතු දිනය | සමාලෝචිත වර්ෂයේ අවසානයට භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | ඉලක්කගත % | තථ්‍ය % |
| 1 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/සී2ඒ | නුවර-මහියංගනය-පදියතලාව මාර්ගය (කි.මී 93.15-102.28) | 06.12.2012 | 100 | 100 |
| 2 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/සී2බී | බදුල්ල -කරමැටිය-ආදාඋල්පත මාර්ගය (කි.මී. 0.0-48.0) | 06.12.2013 | 46.57 | 46.50 |
| 3 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී5 | මහියංගනය-දිඹුලාගල-දළුක්කනේ මාර්ගය (කි.මී.0.0-24.10) | 06.12.2013 | 55.02 | 85 |
| 4 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී5බී | බිබිල-ඌරනිය- මහියංගනය මාර්ගය (කි.මී 22.0-39.58) | 19.03.2014 | 25.01 | 30.40 |
| 5 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී6 | ගල්කුලම-අනුරාධපුර මාර්ගය (කි.මී.0.15) සහ (කි.මී. 16.0-16.64) | 06.11.2013 | 86.95 | 46.07 |
| 6 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී7 | **ඒ)** කඩහපොල-රඹෑවැව මාර්ගය (කි.මී.0.0-18.71) | | 16.58 | 13.80 |
| | | **බී)** කුරුණෑගල-නාරම්මල-මාදම්පෙ මාර්ගය (කි.මී. 0.0-22.36) | 17.06.2014 | 15.02 | 13 |
| | | **සී)** ගලගෙදර-රඹුක්කන මාර්ගය (කි.මී.0.0-18.50) | | 9 | 8 |
| 7 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී11 | තැන්නේකුඹුර-රිකිල්ලගස්කඩ-රාගල මාර්ගය (කි.මී.20.30 - 73.64) | 19.09.2014 | 18.3 | 17.3 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 8 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී12 | උස්වැටකෙයියාව-එප්පාමුල්ල-පමුණුගම මාර්ගය (කි.මී. 0.0 - 8.05) | 08.01.2013 | 71.13 | 57.70 |
| 9 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී13 | පාලවිය කල්පිටිය මාර්ගය (කි.මී.14.0 - 40.60) | 29.05.2014 | 14.04 | 16.00 |
| 10 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී15 | මහියංගනය-දිඹුලාගල-දළුක්කනේ මාර්ගය (කි.මී. 24.10 - 72.8) | 05.06.2014 | 6.38 | 5.43 |
| | | මනම්පිටිය - අරලගංවිල මාදුරුඔය මාර්ගය (කි.මී. 0.0 - 3.0) | | 6.38 | 5.43 |
| 11 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී17 | නුවරඑළිය දිස්ත්‍රික්කයේ පළාත් මාර්ග | 19.03.2014 | 28.37 | 24.6 |
| 12 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/සී1ඒ | හොරවල - පැලවත්ත - පිටිගල මාර්ගය (කි.මී. 0.0 - 17.50) | 05.06.2013 | 38.58 | 26.33 |
| 13 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී4 | තිරුවානකැටිය - අගලවත්ත මාර්ගය (කි.මී. 33.45 - 67.80) | 11.12.2013 | 55 | 15 |
| | | හොරණ - අඟුරුවාතොට අලුත්ගම මාර්ගය (කි.මී. 5.0 - 32.0) | 11.12.2013 | 46.88 | 19.97 |
| | | හොරවල - පැලවත්ත - පිටිගල මාර්ගය (කි.මී. 17.5 - 25.74) | 11.12.2012 | 100 | 27.8 |
| 14 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී9 | මත්තල ගුවන්තොටුපොළ ප්‍රවේශ මාර්ගයේ හම්බන්තොට හන්දිය ගුවන්පාලම තැනීම | 06.12.2013 | 62 | 67 |
| | | අඩි 100 මාර්ගයේ ගුවන්පාලම ඉදිකිරීම හා හම්බන්තොට හන්දිය අතුරු මාර්ගය | 11.12.2013 | 61 | 50 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 15 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී21 | නැවත ඉදිකිරීම/පාලම පුළුල් කිරීම<br>තිරුවානකැටිය - අගලවත්ත මාර්ගය<br>(කි.මී. 33.45 - 67.80) | 05.12.2013 | 51.52 | 33.00 |
| 16 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී24 | නැවත ඉදිකිරීම/පාලම පුළුල් කිරීම<br>හොරණ - අඟුරුවාතොට අලුත්ගම මාර්ගය<br>(කි.මී. 5.0 - 32.0) | 05.12.2013 | 67.77 | 58.50 |
| 17 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී20 | නාගොඩ- කලවැල්ලාව- බැල්ලපිටිය මාර්ගය<br>(කි.මී. 27.0 - 57.0) | 19.03.2014 | 27.25 | 16.30 |
| 18 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී10බී | හුංගම මිද්දෙණිය මාර්ගය<br>(කි.මී. 0.0 - 30.0) | 19.03.2014 | 24.53 | 12.54 |
| 19 | ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී2/පැකේජසී/සී10ඒ | තිහගොඩ- කඹුරුපිටිය- මාවරල- කොටපොල මාර්ගය<br>(කි.මී. 23.0 - 67.0) | 06.04.2014 | 13.95 | 6.34 |